(24)

දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ 5/2008

මගේ අංකය :-ප/5/දෙපා:ච:2008
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2008.11. 17

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2. අංශභාර සියළුම අධ්‍යක්ෂවරුන් වෙත,

## විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම සහ විදුලි ගාස්තු අවම කරගැනීම.

මෙම දෙපාර්තමේන්තුවේ විදුලිය ගාස්තු සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති බව පසු ගිය මාස කිහිපය තුළ ලැබුනු බිල්පත් අනුව පැහැදිලි වේ. සාමාන්‍යයෙන් මසකට දැවෙන විදුලිය ඒකක ගණන 6500 ක් පමණ වී ඇත. විදුලිය ගාස්තු වැඩි වී ඇති බැවින් විදුලිය සඳහා මෙම වර්ෂයට වෙන්කර ඇති ප්‍රතිපාදන මේ වන විටත් අවසන් වී ඇත.

(02). විදුලිය පරිභෝජනය අවම කර ගැනීම සඳහා වරින්වර කරන ලද දැනුවත් කිරීම් වලට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ විදුලි පරිභෝජනය අවම කර ගැනීමට වඩාත් වැඩි අවධානයක් යොමු කළ යුතු අවස්ථාව දැන් පැමිණ තිබේ.

(03). මෙම දෙපාර්තමේන්තුවේ විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම සඳහා සියලුම නිලධාරීන් ගේ හා සේවක මහත්ම මහත්මීන් ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීමට ඒ ඒ අංශවල සියලුම නිලධාරීන් පහත සඳහන් කාර්යයන් පිළිබඳව නැවත දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

- අනවශ්‍ය විදුලි බුබුළු නිවා දැමීම.
- නිලධාරීන් තම කාර්ය ස්ථානයෙන් ඉවත්ව යන සෑම විටම විදුලි පංකා ක්‍රියා විරහිත කිරීම.
- ජලය උණුකරවා ගැනීමට විදුලි කේතලය භාවිතා කිරීම එක් සේවක මහතෙකුට පවරා එක්වර ජලය උණුකර තබා ගැනීමට කටයුතු කිරීම. නිතර නිතර විදුලි කේතලය භාවිතා කර ජලය උණුකර ගැනීමෙන් වැළකීම හා ජලය උණු වීමෙන් පසුව විදුලි කේතලයේ විදුලි සම්බන්ධතාව නතර කිරීම.
- වායු සමීකරණ භාවිතය හැකිතාක් අවම කර ගැනීමටත්, අනවශ්‍ය අවස්ථාවල ඒවා අක්‍රියකර තැබීමටත් කටයුතු කිරීම.

- කාර්යාල වේලාව අවසානයේ සියළු විදුලි බුබුළු හා අනෙකුත් විදුලි උපකරණ සියල්ල නිමා දමා යාමට ඒ ඒ අංශයේ අදාල සේවක මහතුන් වෙත පවරා දැනුවත් කිරීම.
- පරිගණක හා ශීතකරණ සඳහා විදුලිය භාවිතය අරපිරිමැසුම් සහිතව කිරීම.
- කාර්යාල පරිශ්‍රයේ, භෝජනාගාරයේ කාර්යාල ආලින්දයේ හා කොරිඩෝවල විදුලිය භාවිතය ගැන විශේෂ අවධානය යොමු කිරීම.

(05). ඒ අනුව ඉහතින් අපේක්ෂිත පරිදි කටයුතු කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස දන්වන අතර, ඔබ විසින් ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

(06). දෙපාර්තමේන්තු වියදම් අවම කර ගැනීම, රජයේ දේපල සුරකීම හා රජයේ මුදල් අරපිරිමැස්මෙන් වැය කිරීම යන කරුණු සැළකිල්ලට ගෙන විදුලිය සඳහා අධික වියදම් පාලනය කර ගැනීමට සක්‍රීය දායකත්වයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලන අතර, ඒ අනුව ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

එච්.එම්.එස්.පී.හේරත්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.